අධ්‍යක්ෂ මණ්ඩලයේ අත්සන හෝ එම ඔප්පුව හෝ සාධන පත්‍රය අත්සන් කිරීමට යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකුගේ අත්සන ලබා ගැනීමට පෙර, එකී සාක්ෂිකරුවන්ගේ හෝ පාර්ශ්වකරුවන්ගේ සම්පූර්ණ නම් නිශ්චය කර ගත යුතු අතර, එකී යම් පාර්ශ්වකරුවකුගේ හෝ සාක්ෂිකරුවකුගේ නම අනන්‍යතා ලේඛනවල සඳහන් නමට වඩා වෙනස් වේ නම්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය සහතික කිරීමේ දී එම නමින් සහ අත්සනේ ලියන ලද නමින් එකී පාර්ශ්වකරුවා හෝ සාක්ෂිකරුව විස්තර කළ යුතු ය. ලියා අත්සන් කරන තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක, එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ නොතාරිස්ගේ පිටපතට, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තාට බලය පවරමින් අධ්‍යක්ෂ මණ්ඩලය කළ යෝජනා සම්මතයේ පිටපතක් ඔහු විසින් ඇමිණිය යුතු ය.”.

(7) එහි (15) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන්:-

“ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් තබන අවස්ථාවේ දී නොතාරිස්වරයා විසින් ඇටෝර්නි බලකරුගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබාගත යුතු බව

(15අ) ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ඇටෝර්නි බලකරු විසින් ලියා අත්සන් තබනු ලබන අවස්ථාවක දී, නොතාරිස්වරයා විසින්, ඇටෝර්නි බලපත්‍රය අව්‍යාජ හා වලංගු බවටත්, ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් තබන වේලාවේ දී ඇටෝර්නි බලපත්‍රයේ දීමනාකරු ජීවත්ව සිටින බවටත් වන දිවුරුම් ප්‍රකාශයක් ඇටෝර්නි බලකරුගෙන් ලබා ගත යුතු ය.”.

(8) (16) වන රීතියේ -

(අ) එහි (අ) ඡේදයේ, “එහි වරිපනම් අංකය සහ විථියේ නමක් ඇත්නම් එය ද” යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“එහි වරිපනම් අංකය සහ විථියේ නමක් ඇත්නම් එය ද, සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වන

